06

**Samōdhāna: The Journal of Faculty of Social Sciences and Humanities**
2015, Vol. 4 (II) 57-68pp
© The Author 2015
Ed. *Tissa Weerasekara*
Pub. *Publication Section of the Faculty of Social Sciences & Humanities, Rajarata University of Sri Lanka, Mihintale.* ssh.samodhana@gmail.com

# අඹන්ගඟ ආශ්‍රිත පුරාණ අංගම්මැඩිල්ල අමුණ පිළිබඳ විමසුමක්

චන්දන රෝහණ විතානාච්චි[1]

## Abstract

The Angammadilla dam was selected for the purpose of constructing an anchorage in the vicinity of a small island in the left bank of Amban Ganga River. There is evidence that this dam was built using the natural rock that goes up across the river. The dam has been built in order to create water from the natural canal connecting the river to the left bank of the river due to the small island near the left bank. At the present, evidence of this ancient dam can be seen only near the canal on the left bank of the river. It is possible to conclude from the evidence that their width and a long dam constructed entirely across the Amban Ganga River.

**Key words:** Archaeology, Irrigation works, Ancient Technology, Dam,

[1] *ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, සමාජීයවිද්‍යා සහ මානව ශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. chandanawithanachchi@gmail.com*

**ප්‍රවේශය**

ශ්‍රී ලංකාවේ පැරණි වාරි නිර්මාණ සම්බන්ධයෙන් විද්වතුන් විසින් විවිධාකාරයෙන් පර්යේෂණ කටයුතු සිදුකළ ද ක්‍රමයෙන් විනාශවෙමින් පවතින පුරාණ අමුණ සම්බන්ධයෙන් විධිමත් අධ්‍යයනයක් මේ වන තෙක් සිදුවී නොමැත. **හෙන්රි පාකර්** (Parker 1909) හා **බ්‍රෝහියර්** (Brohier 1934) වැනි විද්වතුන් මෙරට ඇතැම් පුරාණ අමුණු සම්බන්ධයෙන් වාර්තාකර තිබුණ ද ඒවායෙහි නිර්මාණාත්මක ස්වභාවය හා ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් ගැඹුරින් අධ්‍යයනය කොට නැත. එහෙත් මීට කලකට පෙර එම අමුණු පැවති ස්වභාවය සම්බන්ධයෙන් හඳුනාගැනීමට එම වාර්තා ඉතාමත් ම වැදගත් වේ. ඔවුන් විසින් වාර්තාකර තිබෙන ඇතැම් පුරාණ අමුණු මේ වන විට එම ස්ථානවල හඳුනාගැනීමට නොහැකි වන ආකාරයෙන් විනාශ වී ගොසිනි. නැතහොත් දක්නට ලැබෙන්නේ ඉතාමත් ස්වල්ප වූ ප්‍රමාණයක් පමණි. ස්වභාවික හා මානව ක්‍රියාකාරකම් නිසා පැරණි අමුණුවල ඉතිරිව තිබෙන කොටස් ද සීඝ්‍රයෙන් විනාශ වී යන ආකාරයක් හඳුනාගත හැකි ය. මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන්නේ පුරාණ අංගමැඩිල්ල අමුණ පිළිබඳ ව අධ්‍යයනය කිරීම ය.

**පිහිටීම**

උතුරු මැද පළාතේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ කළහාගල ග්‍රාමයට ආසන්නයේ සුදුකන්ද පාමුල පිහිටා තිබේ. උතුරු අක්ෂාංශ 7˚ 51' 12.70" හා නැගෙනහිර දේශාංශ 80˚ 54' 37.91" අතර ගොඩනගා තිබෙන මෙම අමුණ ආශ්‍රිත ව උන්නතාංශය මීටර් 70 පමණ වේ. පොළොන්නරුව - කළහාගල අංගම්මැඩිල්ල මාර්ගයේ කිලෝ මීටර් 18 පමණ ගමන් කිරීමෙන් මෙම ස්ථානයට පිවිසිය හැකි ය. වර්තමාන අමුණ ඉදිකර ඇත්තේ ද පුරාණ අමුණ ආශ්‍රිත ව ය. එය 1948-52 අතර කාලයේ ගොඩනගන ලද්දකි.

**ඓතිහාසික පසුබිම**

පළමුවන පරාක්‍රමබාහු (ක්‍රි.ව. 1153-1186) රජු විසින් ඉදිකරන ලද පරාක්‍රම සමුද්‍රයට අවශ්‍ය ජල සම්පාදනය පිණිස මෙම අමුණ කරවූ බව වංසකථාවිසඳහන් වේ (මව. xxix: 25-27). රජු විසින් **කාරගඟ** විශාල ගල්වලින් හරස්කොට අමුණ සාදා එතැන් සිට **ආකාශ ගංගා** නමින් සකස්කරන ලද ඇළ මාර්ගයක් ඔස්සේ පරාක්‍රම සමුද්‍රයට ජලය සැපයූ බව එහි සඳහන් වේ. කාරගඟ අඹන්ගඟ ලෙස හඳුනාගෙන තිබෙන බැවින් වංසකථාවී සඳහන් එම තොරතුරු නිවැරදි බව පැහැදිලි ය. මෙම පුරාණ අමුණ ආශ්‍රිත ගල් පුවරුවල දක්නට ලැබෙන කැඩුම් ලකුණු පොළොන්නරු යුගය නියෝජනය කරන ආයත චතුරස්‍රාකාර ස්වරූපය ගන්නා බැවින් මෙම අමුණ පරාක්‍රමබාහු රජුගේ කාලයේ දී ඉදිකළ බවට වංශකථාවේ සඳහන් වන තොරතුරු නිවැරදි බව තහවුරු වේ. මේ වන විට බෙහෙවින් ම විනාශවී ගොස් තිබෙන මෙම පුරාණ අමුණේ සාක්ෂි ස්වල්ප වශයෙන් දක්නට ලැබෙන්නේ අඹන්ගඟේ වම් ඉවුර ආසන්න ප්‍රදේශයේ පමණි.

**විමර්ශනය**

අමුණ ඉදිකිරීම සඳහා තෝරාගෙන තිබෙන අඹන්ගඟේ මෙම ස්ථානය ඒ සඳහා වඩාත් යෝග්‍ය වූ ස්වභාවයකින් යුක්ත වේ. මෙම අමුණට මීටර් 20 ක් පමණ ඉහළින් අඹන්ගඟේ දකුණු ඉවුරට කොඳුරුවා කන්ද ප්‍රදේශයේ සිට ගලා එන රදවිගේ ඔය එකතු වේ. එමගින් අමතර ජලයක් මෙම ස්ථානයට සපයා දෙනු ලබයි. පුළුල් ලෙස පැතිරී තිබෙන ස්වාභාවික ගල් තලාවකින් යුක්ත මෙම ස්ථානයේ දී මැද දූපතක ස්වරූපයට ඉතිරිවන පරිද්දෙන් අඹන්ගඟේ වම් ඉවුරෙන් ආරම්භ වන විශාල ප්‍රමාණයේ ඇළ මගක් නැවත කි.මී. **½** ක් පමණ දුරකින් අඹන්ගඟට එකතුවීමක් ද දක්නට ලැබේ. මෙය ජලය පිටතට යොමුකිරීම පිණිස කෘතීමව කණින ලද ඇළ මාර්ගයක් බව පෙනේ. මෙම ලක්ෂණ නියමිත පරිදී කළමනාකරණය කිරීම මගින් මෙම ස්ථානයේ කිසිදු අපහසුවකින් තොරව අමුණු බැම්ම ඉදිකරන්නට ඇති බව පැහැදිලි ය (*ඡායාරූපය 1*).

මෙම අමුණු බැම්මේ මේ වන විට ශේෂව තිබෙන්නේ එහි වම් පස කොටසේ නටබුන් පමණි. එසේ වුවද ගැලවී ගිය අමුණු බැම්මේ ගල් කුට්ටි අඹන්ගඟේ දකුණු ඉවුරට ආසන්නයේ විශාල වශයෙන් දක්නට ලැබේ. ඒ අනුව මෙම අමුණු බැම්ම අඹන්ගඟ සම්පූර්ණයෙන් ම හරස්වන පරිදී ගඟ හරහට ඉදිකරන ලද බව තහවුරු වේ. ඒ සඳහා ස්වාභාවික ගල් ස්තරය පාදම ලෙස යොදාගෙන තිබෙන බව පැහැදිලි ය. එම ගල් තලාව වැටියක ස්වරූපයෙන් අඹන්ගඟ හරහට දිවෙන බැවින් ගල් කුට්ටි ඒ අතරට පහසුවෙන් හිරකරන්නට ඇති බව පෙනේ. ගල් තලාවේ තැනින් තැන හාරනු ලැබූ හතරැස් වලවල් රැසක් දක්නට ලැබේ. එම වලක දිග පළල හා ගැඹුර සමාන වන අතර එය සෙ.මී. 27 ක් පමණ වේ. මෙම සිදුරු අමුණු බැම්ම අතරට ශක්තිමත් වීම සඳහා සිරස් කණු යොදන ලද ඒවා බව සිතිය හැකි ය. එම ගල් කණු මැදිවන සේ අමුණු බැම්ම ඉදිකරන්නට ඇත.

අංගම්මැඩිල්ල පුරාණ අමුණේ වම් කොටසේ සැළකිය යුතු ප්‍රමාණයක් මේ වන තෙක් ශේෂව පවතී. අඹන්ගඟින් ඇළ මග වෙන් වන ස්ථානයේ ශේෂව තිබෙන මෙම කොටසින් පුරාණ අමුණු බැම්මක හැරවුමක් සහිත ස්ථානයක ස්වරූපය පිළිබඳව අවබෝධයක් ලබාගත හැකි ය. අඹන්ගඟ හරහා දිවෙන අමුණු බැම්ම මෙම ස්ථානයේ දී ඇළ මග වෙන්වී යන ස්ථානයේ තිබෙන දූපත බඳු කොටසේ දකුණු කෙළවරට සම්බන්ධ කර තිබේ. මෙම ස්ථානයේ දී අමුණු බැම්ම එම දූපත තුළට කිඳාබසින සේ ශක්තිමත්ව සකස්කර තිබෙන ආකාරය හඳුනාගැනීමට පුළුවන. අනතුරුව එම කොටස ආවරණය වන පරිදී අමුණේ වම් ඉවුරු ආරක්ෂිත බැම්ම (සැඩපහන) ඉදිකර තිබේ (*ඡායාරූපය 3-4*).

අමුණු බැම්මේ විශාල ප්‍රමාණයක් විනාශවී ගොස් තිබුණ ද දැනට ශේෂව තිබෙන කොටස්වලින් මෙහි ප්‍රමාණය පිළිබඳව අවබෝධයක් ලබාගත හැකි ය. දැනට වම් ඉවුරේ සිට ගඟ මධ්‍ය දෙසට මීටර් 22.60 ක් පමණ ප්‍රමාණයක අමුණු බැම්මේ නටබුන් දක්නට ලැබෙන මුත් වඩාත් හොඳින් සුරක්ෂිතව ඇත්තේ වම් ඉවුරේ සිට මීටර් 15 ක පමණ කොටසක් පමණි. එම කොටසින් මෙහි උපරිම උස පමණක් නොව පළල පිළිබඳව ද අදහසක් ලබාගත හැකි ය. උපරිම උස අඹන්ගඟේ පතුලේ සිට මීටර් **1½ - 2** අතර ප්‍රමාණයක් වන බව හඳුනා ගැනීමට පුළුවන. උපරිම පළල මීටර් 6.30 කි. මෙම අමුණ පිහිටි ස්ථානය සුදුකන්ද පාමුල බෑවුම් සහිත උස් බිමක පිහිටා තිබෙන බැවින්

පරාක්‍රම සමුද්‍රයේ බිම් මට්ටමට වඩා වැඩි උසකින් පිහිටා ඇත. මේ නිසා මෙම ස්ථානයෙන් ජලය හරවා යැවීමට උසින් වැඩි බැම්මක අවශ්‍යතාවයක් නොවූ අතර සුළු බාධාවකින් ඉහළින් එන ජලය අතුරු ජල මාර්ගය ඔස්සේ ඇළ මගට යොමුකිරීමේ හැකියාව පැවතින. ඒ අනුව මෙම අමුණ අනෙකුත් පැරණි අමුණුවලට සාපේක්ෂව උසින් අඩු ඉදිකිරීමක් බව පැහැදිලිය (ඡායාරූපය).

අඹන්ගඟින් වෙන්වී ගොස් තරමක් දුරින් නැවත ගඟට එකතුවන විශාල ඇළ මග උපයෝගී කරගනිමින් ජලය ඇළ මාර්ගය වෙත යොමුකර ඇත. අඹන්ගඟ හා ඇළ මග වෙන්වන ස්ථානයේ දූපතේ ඉහළ මූනත් කොටස සේදීයාම වැළැක්වීම පිණිස එහි ජල පහරට හසුවන සෑම කොටසක්ම ගල් පුවරු යොදා ආවරණය කර තිබේ (ඡායාරූපය).


අමුණු බැම්ම වම් ඉවුරට සම්බන්ධවන ස්ථානය ගල් වැටියක් මගින් මනාව ආවරණය කර ඇත. මේ නිසා අමුණු බැම්ම ඒ තුළට ගමන්කරන ස්වරූපයක් දක්නට ලැබේ (ඡායාරූපය). එම වැටිය මීටර් 13.50 ක් පමණ දුරක් ගඟ පහළට ගමන්කොට මීටර් 2.40 ක් පමණ දුරක් ඇතුල් දෙසට ගමන් කිරීමට සලස්වා තිබේ. මෙම කොටස වේල්ලක ස්වරූපයකින් යුක්ත වන අතර උස මීටර් 2.50 ක් පමණ වේ. මෙහි ආරම්භක ස්ථානය හෙවත් අමුණු බැම්ම සම්බන්ධ වන ස්ථානයට හොඳින් සකස්කළ ගල් කුට්ටි හා ගල් පුවරු යොදා ඇති මුත් ක්‍රමයෙන් පහළට යත්ම කුඩා ප්‍රමාණයේ ගල් භාවිත කර තිබෙන අයුරු හඳුනාගත හැකි ය. මෙහි ගල් වරි 18 ක් පමණ දක්නට ලැබේ. මෙම ආරක්ෂිත ගල් වැටිය මීටර් 2.50 ක් පමණ ඉවුර තුළට ගමන්කරයි. එතැන් සිට ආරම්භ වන සැඩපහන, පුරාණ රළපනාවක ස්වරූපය ගන්නා ආකාරයට පියගැටපෙළක ආකාරයට අතුරා තිබේ. හොඳින් සකස්කරන ලද මධ්‍ය ප්‍රමාණයේ ගල් කුට්ටි මේ සඳහා යොදාගෙන තිබේ. මෙලෙස යෙදීම මගින් ගල් පුවරු ඉදිරී ගැලවී යාම පාලනය කොට තිබේ. මෙම කොටස අඹන්ගඟ පහළට මීටර් 200 ක පමණ දුරක් දක්නට ලැබේ (ඡායාරූපය හා සැළසුම).

අඹන්ගඟින් වෙන්වී යන හැරවුම් ඇළ මග අතර තිබෙන දූපත කොටසේ මුහුනත නිතරම ජලය සමග ගැටෙන බැවින් එය සේදීයාම වැලැක්වීම පිණිස ද ගල් වැටියක් යොදා තිබේ. එම කොටස මීටර් 14 ක පමණ දිගකින් යුක්ත වන අතර පියගැටපෙළක ආකාරයට අතුරන ලද ගල්වරි 11 ක් හඳුනාගත හැකි ය. මෙය ක්‍රමයෙන් දූපත වටාම සිටින සේ යොදා තිබෙන ආකාරය

හඳුනාගැනීමට පිළිවන. හැරවුම් ඇළේ සැඩ පහර මගින් ඉවුර සේදීයාම මෙමගින් වළක්වා ඇත.

### දිය හැරවුම් ක්‍රමය

මෙම භූමිය ආශ්‍රිතව දක්නට ලැබෙන ස්වභාවය පදනම් කරගෙන මෙම අමුණ ජල හැරවුම් ක්‍රමය සැළසුම් කර තිබෙන බව පැහැදිලි ය. අඹන්ගඟේ ප්‍රධාන ජල මාර්ගයෙන් ස්වාභාවිකව වෙන්වී ගොස් ඊට පහළින් නැවත අඹන්ගඟට ම එකතු වන ජල මාර්ගය හරස්කොට බැම්මක් බැඳ එතැන් සිට ආරම්භ වන ඇළකින් ජලය ලබාගැනීම මෙහිදි සිදුකර තිබේ. මෙම ජල හැරවුම් ක්‍රමය **අංගම්මැදිල්ල දිය හැරවුම් ක්‍රමය** ලෙස ව්‍යවහාරයේ භාවිතවන අතර එම නමින් ම මෙම ස්ථානය ද හඳුන්වා ඇත.




සැළසුම 1. අංගම්මැඩිල්ල වර්ගයේ දිය හැරවුම් ක්‍රමය

### අංගම්මැඩිල්ල වර්ගයේ දිය හැරවුම් ක්‍රමය


ප්‍රධාන ජල මාර්ගයේ ඉදිකොට තිබෙන අමුණ බැම්මට ඉහළින් ආරම්භ වී එම අමුණට තරමක් පහළින් නැවත ජල මාර්ගයට ම එකතු වන පරිදි සකස් කර තිබෙන තරමක් විශාල ඇළ මාර්ගයක් උපයෝගී කර ගනිමින් දිය හරවන ඇළ

මාර්ගය නිර්මාණය කිරීම **අංගම්මැඩිල්ල** දිය හැරවුම් ක්‍රමයේ ප්‍රධාන ලක්‍ෂණය වේ *(සැළසුම 2, ඡායාරූපය 2)*.

අංගම්මැඩිල්ල යන වචනය ව්‍යවහාරයට පැමිණි ආකාරය පිළිබඳ ව පරීක්‍ෂා කිරීමේ දී ඒ සඳහා අදහස් දෙකක් බලපා තිබෙන බව පෙනේ. ඉන් පළමු වැන්න වන්නේ ප්‍රධාන ජල මාර්ගයෙන් වෙන් වී ගොස් නැවත එයට ම එකතුවන පරිදි සකසා තිබෙන අතුරු ජල මාර්ගය, ප්‍රධාන ජල මාර්ගය හා සම්බන්ධ වන අමතර අංගයක් ලෙස සලකා එම කොටස සකස්කිරීම යන අරුතින් අංගම්මැඩිල්ල යන්න නිර්මාණය වූ බවයි. දෙවැනි අදහස වන්නේ අතුරු ඇළ මාර්ගය හෙවත් නව අංගයට බාධාවක් වන ලෙසින් හෙවත් එය මැඩලන පරිද්දෙන් අතිරේක බැම්මක් ඉදිකිරීම යන අරුත ඇතිව අංගම්මැඩිල්ල යන වචනය සකස් වූ බවයි. කෙසේ නමුත් මෙම අදහස් දෙක අතර කිසියම් ආකාරයක සම්බන්ධතාවක් තිබෙන බවද සිතිය හැකිමුත් වඩාත් විශ්වාස කළ හැකි අදහසක් වන්නේ **අංගය මැඩලීම** යන අරුතින් **අංගම්මැඩිල්ල** යන්න නිර්මාණය වූ බවයි.

අංගම්මැඩිල්ල වර්ගයේ දිය හැරවුම් ක්‍රමය ප්‍රධාන වශයෙන් සකසා ඇත්තේ මහවැලි ගඟ, අඹන් ගඟ වැනි වැඩි ජල ප්‍රවාහයක් සහිත ප්‍රමාණයෙන් විශාල ජල මාර්ග ආශ්‍රිත අමුණු සඳහා ය. මෙවැනි දිය හැරවුම් ආශ්‍රිත ව හඳුනා ගත හැකි විශේෂත්වය වන්නේ ප්‍රධාන ජල මාර්ගය හරස්කොට ඉදිකර තිබෙන අමුණු බැම්මට අමතර ව එම ජල මාර්ගයෙන් හැරී ගොස් පහළින් නැවත එයට ම එකතුවන ආකාරයෙන් නිර්මිත අතුරු ජල මාර්ගයේ ද කුඩා ප්‍රමාණයේ අමුණක් ඉදිකර තිබීමයි. හැරවුම් ඇළ මාර්ගය කැපීම සිදුකර ඇත්තේ එම අතුරු ඇළ මාර්ගයේ ද්විතීයික බැම්ම ආසන්නයෙනි. ප්‍රධාන ජල මාර්ගයේ ඉදිකරන ලද අමුණු බැම්ම නිසා බාධාවන ජලය අතුරු ජල මාර්ගයට යොමුකොට එහි තිබෙන බැම්ම මගින් හරවා එතැන් සිට ඇළ මාර්ගය ඔස්සේ අදාල ක්‍ෂේත්‍රයන් වෙත හරවා යැවීම මෙම හැරවුම් ක්‍රමවේදය වේ. අංගම්මැඩිල්ල ක්‍රමයේ දී අතුරු ජල මාර්ගය සකස්කර තිබෙන්නේ ප්‍රධාන ජල මාර්ගයේ ජල පීඩනය වඩා බරවූ ඉවුර දෙසින් වන බැවින් පහසුවෙන් ජලය එයට යොමු කිරීමේ හැකියාව පවතී. අතුරු ජල මාර්ගය ප්‍රධාන ජල මාර්ගයට සමාන්තර ව නිර්මාණය කර තිබෙන අතර ඒ දෙක වෙන්කරන

කොටස ලෙස පිහිටි වැටිය පස් දමා ඉහළට ඔසවා ද්‍රූපතක ආකාරයට නිර්මාණය කර තිබේ (*සැළසුම 1).*




*සැළසුම **2.** අතුරු ජල මාර්ගය ප්‍රධාන ජල මාර්ගයට සමාන්තර ව නිර්මාණය කර ඒ දෙක අතර වැටිය පස් දමා ඉහළට ඔසවා නිර්මාණය කර තිබෙන අයුරු*

අංගම්මැඩිල්ල දිය හැරවුම් ක්‍රමවේදයට පැහැදිලි නිදසුන් වන්නේ අඹන් ගඟ ආශ්‍රිත ව ඉදිකරන ලද ඇළහැර අමුණ, අංගම්මැඩිල්ල අමුණ හා මහවැලි ගඟේ මිණිපේ අමුණ ය. පරාක්‍රම සමුද්‍රයට ජලය සම්පාදනය කිරීමේ අරමුණින් අඹන් ගඟේ ම කරවන ලද අංගම්මැඩිල්ල අමුණ මෙම දිය හැරවුම් ක්‍රමවේදය හඳුන්වන නාමයෙන් ම මේ දක්වාත් ව්‍යවහාර වේ. මහවැලි ගඟ ආශ්‍රිත ව ඉදිකොට තිබෙන මිණිපේ අමුණ සඳහා ද පුරාණයේ මෙන්ම වර්තමානයේ ද භාවිතා කෙරෙනුයේ අංගම්මැඩිල්ල වර්ගයේ දිය හැරවුම් ක්‍රමවේදයයි. එහෙත් මෙහි අතුරු හැරවුම් ඇළ මාර්ගය ප්‍රධාන බැම්මට ඉතා සමීපයෙන් ආරම්භ වී කෙටි දුරකින් නිමා වුව ද ඉහත ක්‍රමවේදය ඒ සඳහා මැනවින් ආදේශ කොට තිබෙන ආකාරය හඳුනාගැනීමට පුළුවන. ප්‍රධාන ජල මාර්ගයෙන් අතුරු ඇළ මාර්ගය ආරම්භ වන ස්ථානය සෝදීයාම වැළැක්වීම සඳහා මනා ලෙස සකස්කරන ලද ආරක්ෂිත බැම්මක් ඉදිකර තිබෙන අතර අංගම්මැඩිල්ල අමුණ ආශ්‍රිත ව මෙය ඉතාමත් පැහැදිලි ව දක්නට ලැබේ. මීට අමතර ව අතුරු ඇළ මාර්ගයේ ඉවුරු සෝදීයාම වැළැක්වීම සඳහා පියගැට පෙළක ආකාරයට ගල් අතුරා සැඩපනාවක් ද නිර්මාණය කර තිබේ. අංගම්මැඩිල්ල ඇළ මාර්ගයෙන් මේ සඳහා නිදසුන් හඳුනා ගත හැකි ය.

අංගම්මැඩිල්ල වර්ගයේ ජල හැරවුම් ක්‍රමයේ පවතින විශේෂ වැදගත්කම වන්නේ වැඩි ජල ප්‍රමාණයක් සහිත අවස්ථාවන් වලදී ජලයේ පීඩනයෙන් අමුණු බැම්ම පමණක් නොව හැරවුම් ඇළ මාර්ගය ද ආරක්ෂා කරගත

හැකිවීමයි. වැඩි ජලය ප්‍රධාන අමුණු බැම්ම මතින් පිටාර දමන බැවින් අතුරු ජල මාර්ගය ඔස්සේ එන ජලයේ වේගය අඩුවීම නිසා පීඩනය පාලනය වීම සිදුවේ. මේ හේතුවෙන් අමුණු බැම්ම පමණක් නොව අතුරු ඇළ මාර්ග ඇතුළු සෙසු වාරි නිර්මාණ ද ආරක්‍ෂා වේ. ඒ අනුව අංගම්මැඩිල්ල ක්‍රමය පරිසර හිතකාමී දිය හැරවුම් ක්‍රමයක් ලෙස හැඳින්විය හැකි ය.

**ඇළ මාර්ගය**

සාමාන්‍ය ව්‍යවහාරයේ අංගම්මැඩිල්ල යෝධ ඇළ නමින් හඳුන්වන මෙම ස්ථානයෙන් ආරම්භ වී පරාක්‍රම සමුද්‍රයට ජලය ගෙන යන ඇළ මාර්ගය වංසකථාව් හඳුන්වා ඇත්තේ **"ආකාශ ගංගා"** යන නමිනි (මව. lxxix: 25-26). අඹන්ගඟේ ජලය අංගම්මැඩිල්ල අමුණට ඉහළින් ඉදිකර තිබෙන ඇළහැර අමුණෙන් සම්පූර්ණයෙන්ම හරවා මින්නේරිය, ගිරිතලේ, කවුඩුල්ල හා කන්තලේ වාරි නිර්මිත සඳහා යොදාගෙන තිබෙන බැවින් එතැනින් පහළට අඹන්ගඟේ ගලා එන ජලය පරාක්‍රම සමුද්‍රය පිරවීම සඳහා ප්‍රමාණවත් නොවීය. මේ හේතුවෙන් අතිරේක ජල ප්‍රමාණයක් අඹන්ගඟට ලබාගැනීම පිණිස පළමුවන අග්ගබෝධි **(ක්‍රි.ව. 575-608)** රජු විසින් කරවන ලද මිණිපේ අමුණෙන් ආරම්භ වන යෝධ ඇළ පළමුවන පරාක්‍රමබාහු රජු විසින් දීර්ඝ කොට මෙම අමුණට ඉහළින් අඹන්ගඟට එකතුකළ බවට මතයක් මෙම ප්‍රදේශයේ පවතී. මෙම ඇළ මග සොයාගැනීම සම්බන්ධයෙන් චර්චිහිල්, ඇඩම්ස් හා බේලි යන තිදෙනා 1855 දී උත්සාහ ගෙන තිබේ (Adams, Churchill, and Bailey. Ceylon Almanac. 1857: 2–3). බ්‍රෝහියර් පවසා ඇත්තේ නියඟ කාලවලදී අඹන්ගඟේ වතුර සම්පූර්ණයෙන්ම ඇළහැර ඇළෙන් ම හරවන්නට ඇති නිසා අංගම්මැඩිල්ල අමුණේ ජලය වැඩි කිරීම පිණිස මිණිපේ ඇළ මගින් මහවැලි ජලය අඹන්ගඟට එකතු කරන්නට ඇති බවයි (Brohier. 1934: part 1: 7). මෙම අදහස මිණිපේ ඇළ හා අංගම්මැඩිල්ල අතර ප්‍රදේශයේ සිදුකරන ලද පරීක්‍ෂණවලින් තහවුරු වූ බව ද ඔහු පවසා තිබේ (Brohier. 1934. part : 7)' මෙම අමුණට කි.මී. භාගයක් පමණ ඉහළින් අඹන්ගඟට එකතුවන ඇළ මාර්ගය මේ නිසා සකස්වූවක් බව විශ්වාස කළ හැකිය. කැපූ ඇළ ක්‍රමයෙන් වෙනස්වී එයට අවට ප්‍රදේශයේ ජලය එකතු වීමෙන් ස්වාභාවික දිය පහරක් බවට

පත්වන්නට ඇත. ඒ අනුව පරාක්‍රමබාහු රජු විසින් මිණිපේ අමුණ ප්‍රතිසංස්කරණය කොට මිණිපේ ඇළ මාර්ගය අංගම්මැඩිල්ල දක්වා දීර්ඝ කරන්නට ඇති බව පැහැදිලි වේ. මහවැලි ගඟේ මිණිපේ අමුණ හා අඹන්ගඟේ අංගම්මැඩිල්ල අමුණ අතර භූමියේ පවතින උන්නතාංශයේ වෙනස්කම මේ සඳහා යොදාගන්නට ඇති බව සිතිය හැකි වේ.

**ආශ්‍රිත ග්‍රන්ථ**

***මහාවංසය***, 1967, සංස්. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි, බටුවන්තුඩාවේ දේවරක්ෂිත පඬිතුමා, කොළඹ, රත්නාකර පොත් වෙළඳ ශාලාව.

විතානාච්චි, සී. ආර්. 2012, ***පුරාණ ශ්‍රී ලංකාවේ අමුණු භාවිතය, තාක්ෂණය සහ ශිල්ප ක්‍රම පිළිබඳ සමාජ පුරාවිද්‍යාත්මක විමර්ශනයක්***, දර්ශන ශූරි උපාධි නිබන්ධය, කොළඹ, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය.

Adams, A.Y., 1857, On the Yodia Bande Ella, by which the Water of the Kalooganga was Conducted to the Ambanganga, into which if fell at the Point at which the Dam was Constructed, for the Purpose of turning the waters of both rivers into the, Sea of Parakrama'', ***Ceylon Almanac***, Colombo, Appendix: pp.14-15.

Brohier, R.L., 1934 (1979), ***Ancient Irrigation Works in Ceylon***. Part i-iii. Colombo, Ministry of Mahaweli Development.

Parker, H., 1909 (1981), ***Ancient Ceylon***, New Delhi, Asian Educational Services.



*ඡායාරූපය 1. පරාක්‍රම සමුද්‍රයට පමණක් ජලය ලබාදීමට ඉදිකළ අංගම්මැඩිල්ල අමුණ*




*ඡායාරූපය 2. අංගම්මැඩිල්ල අමුණේ දිය හැරවුම් ක්‍රමය පෙන්නුම් කරන ඇළහැර අමුණේ ගුවන් දර්ශනයක්*



ඡායාරූපය 3. අංගම්මැඩිල්ල අමුණේ ඇල මාර්ගය ආවරණය කොට ඇති ආකාරය



ඡායාරූපය 4. අංගම්මැඩිල්ල අමුණේ ඉවුරු ආරක්ෂණය